# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1788/36 – 2012 දෙසැම්බර් 13 වැනි බ්‍රහස්පතින්දා – 2012.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 305 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/6/2012/එච්ඩබ්/214.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/ඉඅත්/186.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හංවැල්ල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුවක්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එච්එන්ඩබ්/2010/231 හා 2010.08.25 දිනැති



අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0085ක් පමණ වූ කම්මල්පිටියවත්ත නමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කම්මල්පිටියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0085ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: පාර (මා.සං.අ.); දකුණට: ඒ. ඩී. එන්. අබේසිංහ, ඒ. ඩී. පී. වික්‍රමතුංග හිමිකම් කියන කම්මල්පිටියවත්ත සහ එස්. රූපසිංහ සහ තවත් අය හිමිකම් කියන මදටියවත්ත; බටහිරට: පාර (මා.සං.අ.).

12 - 823

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2012 අංක 307 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2004/එච්ඒ/152.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: වෙන්/ප්‍රාලේ/ඉඅත්/90/1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 11 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වෙන්නප්පුව.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කම්මල්පත්තුව සුළු කොට්ඨාසයේ, උල්හිටියාව උතුර ගමේ පිහිටි පුත්තලම කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2009.10.22 දින පිළියෙල කරන ලද අංක මු.පි.පු. 4409 දරන පිඹුරේ කැබලි අංක 1, 2 හා 3 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.301ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටස් තුනට (3)ට මායිම්:

01. **කැබලි අංක 01 – බෙල්මොන්ට්වත්ත, වරි. අංක 62/5, කොළඹ පාර – ප්‍රමාණය: හෙක්. 0.080**

උතුරට: මාර්ගය (මු.පි.පු. 2961හි කැබලි අංක 2); නැගෙනහිරට: කැබලි අංක 2 සහ ඇනිටා මියුරිල් බාලසූරිය හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 12/1 දරන කජුගහවත්ත; දකුණට: ඇනිටා මියුරිල් බාලසූරිය හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 12/1 දරන කජුගහවත්ත, ජේ. කේ. එම්. පෙරේරාගේ උරුමක්කාරයින් හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 14/1 දරන ඇහැටුගහවත්ත සහ බ්‍රිජට් මෙරායල් පෙරේරා හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 16/ඒ දරන ඇහැටුගහවත්ත; බටහිරට: පොලිස් දෙපාර්තමේන්තුව හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 62/8 දරන බෙල්මොන්ට්වත්ත (මු.පි.පු. 2961හි කැබලි අංක 1).

02. **කැබලි අංක 02 – බෙල්මොන්ට්වත්ත, වරි. අංක 62/4, කොළඹ පාර – ප්‍රමාණය: හෙක්. 0.087**

උතුරට: මාර්ගය (මු.පි.පු. 2961හි කැබලි අංක 2); නැගෙනහිරට: කැබලි අංක 3; දකුණට: එල්. පීටර් ඇලෝසියස් පෙරේරා හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 68/5 දරන කොස්ගහවත්ත සහ ඇනිටා මියුරියල් බාලසූරිය හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 12/1 දරන කජුගහවත්ත; බටහිරට: කැබලි අංක 1.

03. **කැබලි අංක 03 – බෙල්මොන්ට්වත්ත, වරි. අංක 62, 62/1 සහ 62/3, කොළඹ පාර – ප්‍රමාණය: හෙක්. 0.134**

උතුරට: මාර්ගය (මු.පි.පු. 2961හි කැබලි අංක 2); නැගෙනහිරට: මාර්ග (මා.සං.අ.); දකුණට: කේ. සී. බී. ලොයිටස් පෙරේරා හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 68/1 දරන කොස්ගහවත්ත, අඹගහවත්ත නොහොත් මාදංගහවත්ත සහ එල්. පීටර් ඇලෝසියස් පෙරේරා හිමිකම් කියන කොළඹ පාර, වරි. අංක 68/5 දරන කොස්ගහවත්ත; බටහිරට: කැබලි අංක 2.

12 - 824

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2006 අගෝස්තු මස 15 වැනි දින අංක 1458/6 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2006 අංක 265 දරන ආඥාවේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' සිට 'සී' දක්වා වූ ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2005/යූඩී/145(එල්යූ).
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:

එල්ඊඅයි/සීඩීපී/එන්අයි/බීආර්2(බීඕඩීඅයි-ආර්ඩී).
2012 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්මලාන (දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන කලාප අංක 30) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පි.පි.කො. 9057 දරන මූලික පිඹුරේ කැබලි අංක 7 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0005ක් පමණ වූ ගොරකගහවත්ත නමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 07 – ගොරකගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0005ක් පමණ**

උතුරට: බෝධිරුක්ඛාකාරාම පාර සහ ගොරකගහවත්ත; නැගෙනහිරට: ගොරකගහවත්ත; දකුණට: ගොරකගහවත්ත සහ කැබලි අංක 6; බටහිරට: කැබලි අංක 6.

12 - 825

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2010 ජුනි මස 22 වැනි දින අංක 1659/11 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2010 අංක 97 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 460 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1079 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර

තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/එච්ඩබ්/122.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/2/1/76(III).
2012 දෙසැම්බර් මස 11 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදපත්තුව සුළු කොට්ඨාසයේ වතුරුගම, ඉඳුරුගල්ල යන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2011.04.23 දිනැතිව නිකුත් කර නැවත 2011.08.06 දිනැතිව සංශෝධනය කර සකස් කරන ලද අංක ගම්/3786 දරන මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0040ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 82 – මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0040ක් පමණ**
උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ අයිතිකරු සොයාගත නොහැකි මිල්ලගහවත්ත; නැගෙනහිරට: අයිතිකරු සොයාගත නොහැකි මිල්ලගහවත්ත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ කැබලි අංක 83; බටහිරට: කැබලි අංක 83 සහ මාර්ගය (මා.සං.අ.).

12 - 826

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.